ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

**යොවුන් කඳවුර - 2026**

**"වෙනස් වන ලෝකයක මානව හිමිකම් සුරැකීම සඳහා තරුණ නායකත්වය: අඛණ්ඩතාවය, සහභාගීත්වය හා වගකීම්සහගත පුරවැසිභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා තරුණ පරපුර බලගැන්වීම."**

ශ්‍රී ලංකාව සීඝ්‍රයෙන් වෙනස් වන සාමාජීය, ආර්ථික හා තාක්ෂණික තත්වයන්ට මුහුණ දෙමින් සිටින අතර, එමගින් විශේෂයෙන්ම තරුණ ප්‍රජාවට බලපාන ප්‍රභල මානව හිමිකම් අභියෝග රැසක් නිර්මාණය වී ඇත. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය, නීතිමය ආරක්ෂාව සහ අධ්‍යාපනයට ඇති ප්‍රවේශය ශක්තිමත් කිරීමෙහිලා සැළකිය යුතු ප්‍රගතියක් ලබා තිබුණද, මත්ද්‍රව්‍ය භාවිතය, අල්ලස් හා දූෂණය, සයිබර් අපරාධ, ව්‍යාජ තොරතුරු සංසරණය, ද්වේෂසහගත ප්‍රකාශ, ප්‍රචණ්ඩත්වය, වෙනස් කොට සැලකීම, පාරිසරික විනාශය සහ මානසික සෞඛ්‍ය ගැටලු වැනි කාලීන අභියෝග මූලික මානව හිමිකම් සහ නිදහස භුක්ති විඳීමට තවදුරටත් බලවත් තර්ජනයක් එල්ල කරයි.

තරුණ ප්‍රජාව ශ්‍රී ලංකා ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් නියෝජනය කරන අතර රටේ අනාගතය සකස් කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, රට තුළ මානව හිමිකම් ආරක්ෂා කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ තම බලතල ඉටු කරමින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව **"වෙනස් වන ලෝකයක මානව හිමිකම් සඳහා තරුණ නායකත්වය: අඛණ්ඩතාවය, සහභාගීත්වය සහ වගකීම්සහගත පුරවැසිභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා තරුණ පරපුර බලගැන්වීම"** යන තේමාව යටතේ යොවුන් කඳවුරක් පැවැත්වීමට අපේක්ෂා කරයි. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ නැගී එන මානව හිමිකම් අභියෝග තේරුම් ගන්නා සහ තම ප්‍රජාවන් තුළ ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය දැනුම, ප්‍රායෝගික කුසලතා සහ වටිනාකම්වලින් සන්නද්ධ වූ නව තරුණ පරම්පරාවක් බිහි කිරීමයි. එමෙන්ම තරුණ ප්‍රජාවට රටෙහි ක්‍රියාශීලි පුරවැසියන් බවට පත්වීමටද මෙමගින් අපේක්ෂා සපයනු ලබයි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2018 හා 2019 වසරවල ඉතා සාර්ථක යොවුන් කඳවුරු දෙකක් පවත්වන ලදියි. මෙකී කඳවුර වෙනුවෙන් දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ඉලක්ක කොටගෙන තරුණ පිරිස් සම්බන්ධ කරගනු ලැබේ. යොවුන් කඳවුර තුලදී අන්තර්ක්‍රියාකාරී ඉගෙනීම, නායකත්ව සංවර්ධනය, ප්‍රායෝගික අභ්‍යාස, කණ්ඩායම් සාකච්ඡා, නිරූපණ, ප්‍රජා ක්‍රියාකාරකම් සැකසීම සහ කණ්ඩායම්

ගොඩනැගීමේ ක්‍රියාකාරකම් හරහා, කාලීන මානව හිමිකම් ගැටලු විවේචනාත්මකව පරීක්ෂා කිරීමට, නායකත්ව සහ සන්නිවේදන කුසලතා ශක්තිමත් කිරීමට, නීතිගරුක තීරණ ගැනීමට සහ තම ප්‍රජාවට බලපාන අභියෝගවලට ප්‍රායෝගික විසඳුම් සෙවීමට සහභාගිවන්නන්ට අවස්ථාව සැලසේ. තරුණ නායකත්වය සහ සිවිල් සහභාගීත්වය වෙනුවෙන් ආයෝජනය කිරීමෙන්, ශ්‍රී ලංකාව පුරා සමානතාව, අඛණ්ඩතාවය, ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වය සහ මානව ගෞරවය ප්‍රවර්ධනය කිරීමට කැපවුණු තරුණ මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ දීපව්‍යාප්ත ජාලයක් නිර්මාණය කිරීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

මෙම වැඩසටහන විශේෂයෙන්ම පහත සඳහන් දෑ අරමුණු කරයි:

- මූලික මානව හිමිකම් සහ කාලීන සාමාජීය, ආර්ථික, පාරිසරික හා තාක්ෂණික අභියෝගවලට ඒවායේ ඇති අදාළත්වය පිළිබඳ තරුණ පරම්පරාවේ අවබෝධය නැංවීම.
- මත්ද්‍රව්‍ය භාවිතය, දූෂණය, ඩිජිටල් අයිතිවාසිකම්, සයිබර් ආරක්ෂාව, අව්‍යාජ තොරතුරු සංසරණය, වෙනස් කොට සැලකීම, පාරිසරික සාධාරණත්වය, මානසික සෞඛ්‍යය සහ වගකීම්සහගත පුරවැසිභාවය ඇතුළු නැගී එන මානව හිමිකම් ගැටලු පිළිබඳ අවබෝධය වැඩි කිරීම.
- අඛණ්ඩතාව, වගවීම, සමානතාව, සහභාගීත්වය, වෙනස් කොට නොසැලකීම සහ විවිධත්වයට ගරු කිරීම යන අගයන් ප්‍රවර්ධනය කිරීම.
- තරුණ පරම්පරාව තුළ නායකත්වය, සන්නිවේදනය, කණ්ඩායම් හැඟීම, ගැටලු විසඳීම සහ නීතිමය මෙන්ම සාමාජීය නියෝජන කුසලතා වර්ධනය කිරීම.
- පාසල්, විශ්වවිද්‍යාල, රැකියා ස්ථාන සහ ප්‍රදේශීය ප්‍රජාවන් තුළ මානව හිමිකම්, යහපාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදී අගයන් ප්‍රවර්ධනය කිරීම සඳහා තරුණයන්ගේ අර්ථවත් සහභාගීත්වය දිරිමත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමින් මානව හිමිකම් අවබෝධය, සාමාජීය වගකීම සහ සිවිල් සහභාගීත්වය ප්‍රවර්ධනය කරන ප්‍රජා මූලික වැඩසටහන් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට සහභාගිවන්නන් බලගැන්වීම.
- ශ්‍රී ලංකාව පුරා මානව හිමිකම් ගරු කිරීම හා ප්‍රවර්ධනය කිරීමට දායක වන තරුණ මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ දීපව්‍යාප්ත ජාලයක් පිහිටුවීම.

**වැඩසටහන් තොරතුරු**

- **යෝජිත දින**: 2026 ඔක්තෝබර් 26 සිට 2026 ඔක්තෝබර් 31 දක්වා
- **ස්ථානය**: සහභාගි වන්නන් හට පසුව දැනුම් දෙනු ලැබේ
- **සහභාගිවන්නන්**:
    - ශ්‍රී ලංකාවේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක 25 ම නියෝජනය වන පරිදි තරුණ තරුණියන් 55 දෙනෙකුගෙන් මෙම කඳවුර සමන්විත වේ.
    - එක් දිස්ත්‍රික්කයකින් සහභාගිවන්නන් දෙදෙනෙකු බැගින් (හැකි සෑම විටම ස්ත්‍රී පුරුෂ සමබරතාවය තහවුරු කරමින්) තෝරා ගනු ලබන අතර, ඒ අනුව දිස්ත්‍රික් නියෝජිතයින් 50 දෙනෙකු ඇතුළත් වේ.
    - වැඩසටහන පුරා විවිධත්වය, අන්තර්ග්‍රහණය, සමාන සහභාගීත්වය සහ අර්ථවත් නියෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා ආබාධිත පුද්ගලයන් සහ අනෙකුත් ආන්තීකරණයට

ලක්වූ කණ්ඩායම්වල පුද්ගලයන් ඇතුළුව අතිරේක සහභාගිවන්නන් පස්දෙනෙකු (05) තෝරා ගනු ලැබේ.

**අයදුම්කරුවන් සඳහා වන මූලික සුදුසුකම් සහ අවශ්‍යතා**

සියලුම අයදුම්කරුවන් පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය:

- **වයස් සීමාව**: වයස අවුරුදු 18 ත් 29 ත් අතර විය යුතුය.
- **සන්නිවේදන හැකියාව**: සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් එකකින් සාර්ථකව සන්නිවේදනය කිරීමට හැකියාව තිබීම.
- **සක්‍රීය සහභාගීත්වය**: කඳවුරේ සමස්ත කාලසීමාව පුරා පැවැත්වෙන සියලුම ක්‍රියාකාරකම් සහ අභ්‍යාස සඳහා පූර්ණ හා සක්‍රීය දායකත්වය ලබා දීමට ඇති හැකියාව සහ කැපවීම.
- **විවෘත මනස සහ විවිධත්වයට ගරු කිරීම**: කුතුහලයෙන් හා විවෘත මනසකින් යුතුව කටයුතු කිරීම; විවිධත්වය, බහුවිධතාව සහ අන්‍යයන්ගේ සමාජීය යථාර්ථයන් අගය කිරීමට හා පිළිගැනීමට ඇති කැමැත්ත.
- **ඉගෙනීමට ඇති උනන්දුව**: නායකත්ව සංවර්ධනය සහ කඳවුරේදී සාකච්ඡා කෙරෙන මූලික වටිනාකම් කෙරෙහි උනන්දුවක් දැක්වීම (විශේෂයෙන්ම මානව හිමිකම්, අන්තර්ග්‍රහණය, විවිධත්වය, බහුවිධතාව සහ අන්තර් සංස්කෘතික සංවාද කෙරෙහි අවධානය යොමු කෙරේ).
- **ප්‍රජා මූලික ක්‍රියාකාරකම් සඳහා කැපවීම**: තරුණ කඳවුරෙන් පසුව, තම ප්‍රදේශීය ප්‍රජාවන් තුළ මානව හිමිකම් සුරැකීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒ හා සම්බන්ධ ප්‍රජා ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට ඇති කැපවීම සහ පෙළඹවීම.
- **වගකීම්සහගත බව සහ කණ්ඩායම් හැඟීම**: තමන් වෙත පැවරෙන කාර්යයන් වගකීමෙන් යුතුව ඉටු කිරීම, පුද්ගලික හා සමාජීය සංවර්ධනයට දායක වීම සහ විවිධ පසුබිම්වලින් පැමිණෙන අනෙකුත් සහභාගිවන්නන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමේ හැකියාව.
- **සංවිධානාත්මක සබඳතා**: වැඩසටහන් කාලසීමාව තුළදී මෙන්ම ඉන් පසුවද මානව හිමිකම් ප්‍රවර්ධනය සඳහා තරුණ දායකත්වය ඵලදායී ලෙස ලබා දීමට හැකි වන පරිදි, යම් සංවිධානයක, ජාලයක, ආයතනයක, විධිමත් හෝ අවිධිමත් තරුණ කණ්ඩායමක සාමාජිකයෙකු වී සිටීම.

**පිරිවැය**

- කඳවුර පවත්වන කාලසීමාව තුල සියලුම නේවාසික පහසුකම් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සපයනු ලබන අතර ඒ සඳහා සියලුම වියදම් ද මානව හිමිකම් කොමිෂන් සභාව මඟින්ම දරනු ලැබේ .
- යොවුන් කඳවුර සහභාගී වීම සඳහා ඇරීමට සිදු වන ප්‍රවාහන වියදම් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් දරනු ලබන අතර එම වියදම් පියවීමේදී මානව හිමිකම් කොමිෂන් සභාවෙහි නීති රීතිවලට අනුගත වීමට සිදු වේ. කඳවුර පැවැත්වෙන සියළුම දිනයන් හී එයට සහභාගී වූවන්ට පමණක් කඳවුර පැවැත්වෙන අවසන් දිනය තුල ප්‍රවාහන වියදම් ගෙවනු ලැබේ .
- මෙම තරුණ කඳවුර සඳහා තේරී පත්වන්නන්ට මේ පිළිබඳව වැඩිපුර විස්තර ලබාදෙනු ලැබේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

- මේ සමඟ අමුණා ඇති අදාළ අයදුම්පත ඊට අදාළ අනෙකුත් ලිපි ලේඛනද සමඟ **2026 අගෝස්තු මස 31** දින හෝ එදිනට පෙර **[hrcsl.youthcamp@gmail.com](mailto:hrcsl.youthcamp@gmail.com)** යන විද්‍යුත් ලිපිනය හරහා ලැබීමට සලස්වන්න.
- සියලුම තේරීම් කටයුතු ඉහත සඳහන් නිර්ණායක මත පදනම්ව (එක් දිස්ත්‍රික්කයකින් දෙදෙනෙකු බැගින්) මානව හිමිකම් කොමිෂන් සභාව මඟින් තෝරාපත්කරගත් කමිටුව මගින් අයදුම්පත්‍රයේ සඳහන් කරුණු මත සිදු කෙරෙන අතර, ඒ සම්බන්ධව මානව හිමිකම් කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.
- ඔබට යම්කිසි වැඩිදුර පැහැදිලිකිරීමක් අවශ්‍ය නම් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන් අංශය දුරකථන අංක 011-2505569 ඔස්සේ අමතන්න.

ලේකම්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**යොවුන් කඳවුර – 2026**

**අයදුම්පත්‍රය**

**අත්‍යවශ්‍ය උපදෙස්:**

1. සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟ අනෙකුත් සහතික පිටපත් අනිවාර්යයෙන්ම අමුණා එවිය යුතුය.
2. අයදුම්පතේ සඳහන් කරුණු සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ නිල බලය ලත් රාජ්‍ය නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය.
3. විශ්වවිද්‍යාල සිසුවකු නම් විශ්වවිද්‍යාලය විසින් නිකුත් කර ඇති හැඳුනුම්පතෙහි සහතික පිටපතක් අමුණා එවිය යුතුය.

**මෑතකදී ගන්නා ලද විදේශගමන් බලපත්‍ර ප්‍රමාණයේ (Passport Size) ඡායාරූපයක් මෙහි අලවන්න**

**අ) පෞද්ගලික තොරතුරු**

1. **සම්පූර්ණ නම:** )
   ..........................................................................................................................................
   ..........................................................................................................................................
   ....................................
2. **මුලකුරු සමඟ නම:**
   ..........................................................................................................................................
   ..................................................................................
3. **ස්ත්‍රී / පුරුෂ භාවය:** ස්ත්‍රී [ ] පුරුෂ [ ] වෙනත් [ ]
4. **උපන් දිනය:** (අවු/මා/දි) ........ / ........ / ................
5. **වයස** *(2026.10.26 දිනට)*: අවුරුදු ........ මාස ........
6. **ජාතික හැඳුනුම්පත් අංකය:** ................................................ (පිටපතක් ඇමිණිය යුතුය)

7. **ස්ථිර ලිපිනය:**
.............................................................................................................................................
.............................................................................................................................................
.....................................
8. **දුරකථන අංකය:** (ජංගම) ...................................... (නිවස) ......................................
9. **විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail)**: .............................................................................
10. **පරිපාලන දිස්ත්‍රික්කය:** ..............................................
11. **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:** ..............................................
12. **ග්‍රාම නිලධාරී වසම සහ අංකය:** ..............................................

**ආ) අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්**

- අධ්‍යාපනය ලැබූ පාසල / ආයතනය / විශ්වවිද්‍යාල:
  ........................................................................................
- ........................................................................................
- .........................................................................................
- ........................................................................................
- ........................................................................................
- .........................................................................................
- ........................................................................................
- වෘත්තීය හෝ උසස් අධ්‍යාපන සුදුසුකම්
- .........................................................................................
- .........................................................................................
- .........................................................................................
- .........................................................................................
- .........................................................................................
- .........................................................................................
- ........................................................................................

**ඇ) විෂය බාහිර, නායකත්ව සහ ප්‍රජා සංවර්ධන කටයුතු**

1. සමාජයට සහ ප්‍රජාවට ඔබගෙන් වී ඇති දායකත්වය කෙටියෙන් පැහැදිලි කරන්න *(වචන 50කට නොවැඩි)*:
   .............................................................................................................................................
   .............................................................................................................................................
   .............................................................................................................................................
   .............................................................................................................................................
   .............................................................................................................................................
   .............................................................................................................................................
   .............................................................................................................................................

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

2. ඔබ දැනට නියෝජනය කරන හෝ සක්‍රීයව කටයුතු කරන සංවිධානය / ජාලය / ආයතනය / කණ්ඩායම පිළිබඳ විස්තර:
    - සංවිධානයේ/කණ්ඩායමේ නම:
      ..............................................................................................................................
    - ඔබ දරන තනතුර/කාර්යභාරය:
      ..........................................................................................................................................
      ..........................................................................................................................................
      ..........................................................................................................................................
      ..........................................................................................................................................
      ..........................................................................................................................................

3. මෙම යොවුන් කඳවුරට සහභාගී වීමට ඔබ අපේක්ෂා කරන්නේ මන්දැයි පැහැදිලි කරන්න *(වචන 100කට නොවැඩි)*:
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..............................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

## ඇ) අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති සියලුම තොරතුරු මාගේ දැනුම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි. යම් හෙයකින් මෙහි සඳහන් කර ඇති තොරතුරක් අසත්‍ය හෝ නිරවද්‍ය නොවන බවට තහවුරු වුවහොත්, මෙම වැඩසටහන සඳහා මා තේරී පත්වීමට ඇති සුදුසුකම අහෝසි වන බවට එකඟ වෙමි.

.................................................... ....................................................

**දිනය** **අයදුම්කරුගේ අත්සන**

## ඉ) සහතික කිරීම

*(සාමදාන විනිශ්චයකාරවරයෙකු / නීතිඥවරයෙකු / රාජ්‍ය නිලධාරියෙකු / විදුහල්පතිවරයෙකු විසින් සම්පූර්ණ කළ යුතුය)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන මම දන්නා හඳුනන ............................................................................ ........................................................................................................ යන අය විසින් මා ඉදිරියේදී මෙයට අත්සන් තැබූ බවත්, එහි සඳහන් කරුණු සත්‍ය සහ නිවැරදි බවත්, අයදුම්කරු විසින් අමුණා ඇති ග්‍රාම නිලධාරී සහතිකය පරීක්ෂා කර බලා එය නිවැරදි බවටත් මෙයින් සහතික කරමි.

....................................................

**සහතික කළ නිලධාරියාගේ අත්සන නිල මුද්‍රාව**

**නම:** ...............................................................................<br>
**තනතුර:** .........................................................................<br>
**ලිපිනය:** .......................................................................<br>
**දුරකථන අංකය:** ................................................................<br>
**දිනය:** ..............................................................................